# සම සාධාරණත්වය, විවිධත්වය සහ අන්තර්කරණය පිළිබඳ ප්‍රතිපත්තිය

මානවශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය,
ශ්‍රී ලංකාව

අන්තර්කරණ කේන්ද්‍රය විසින් යෝජනා කරන ලදි.

## සම සාධාරණත්වය, විවිධත්වය සහ අන්තර්කරණය පිළිබඳ ප්‍රතිපත්තිය

### 1. හැඳින්වීම

මානවශාස්ත්‍ර පීඨයේ 373 වන පීඨ මණ්ඩල රැස්වීමේ දී (‘පීඨය’) 2024.01.10 දින තීරණය කරන ලද්දේ සියලු පුද්ගලයන්ගේ සමානාත්මතාවට ගරු කිරීමට ඇති කැපවීම තහවුරු කිරීමේ සහ ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමටය. මෙම ප්‍රතිපත්තිය සම සාධාරණත්වය, විවිධත්වය සහ අන්තර්කරණය සම්බන්ධයෙන් පීඨයේ විෂය පථයට අයත් වන ශාස්ත්‍රීය, පරිපාලන සහ වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් පීඨය තුළ තීරණ ගැනීම සඳහා මග පෙන්වනු ඇත.

මෙම පීඨය 1875 දී ආරම්භ කරන ලද විද්‍යාලංකාර උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආරම්භය දක්වා දිවයයි. ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මානවශාස්ත්‍රයන් සඳහා වෙන් කර ඇති එකම පීඨය මෙයයි. වර්තමානයේ මානවශාස්ත්‍ර පීඨය අධ්‍යයනාංශ එකොළහකින්, මධ්‍යස්ථාන සහ ඒකක අටකින්, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 121කින් සහ ආසන්න වශයෙන් උපාධි අපේක්ෂකයින් 2500කින් සමන්විත වේ. භාෂාව, ආගම සහ ලලිත කලා කෙරෙහි අවධානය යොමු කෙරෙන වැඩසටහන් මාලාවක් පීඨය මඟින් පිරිනමනු ලැබේ.

1978 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති කැලණිය විශ්වවිද්‍යාලය තුළ මෙම පීඨය පිහිටා ඇති බැවින් එය පොදු ආයතනයකි. ශ්‍රී ලංකාවේ, රජයේ අරමුදල් ලබන විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අදහස් ප්‍රකාශ කිරීම නිදහසේ කොටසක් ලෙස පිළිගෙන ඇති ආයතනික ස්වාධිපත්‍යය සහ අධ්‍යයන නිදහස පදනම් කරගෙනය.[1] විශ්වවිද්‍යාල පනත යටතේ එයට ලැබී ඇති බලය ප්‍රකාරව පීඨය කටයුතු කළයුතු අතර කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවට සහ සනාතන සභාවට වගකිව යුතුය. තවද, රාජ්‍ය ආයතනයක් ලෙස, පීඨය මූලික අයිතිවාසිකම් ඇතුළු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කළ යුතුය.

අන්තර්කරණය යනු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිළිගත් වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමට සහ සමානාත්මතාවට ඇති අයිතියේ අංගයකි. වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමේ අයිතිය විශ්වවිද්‍යාල පනත යටතේ විශේෂයෙන් පිළිගැනේ.

> *29 (ඇ) සහ 31 වගන්තිවල විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයක් ලිංගභේදය හෝ ජාතිය, ආගම හෝ පන්තිය කුමක් වුවත් සියලුම පුද්ගලයන්ට සහ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව වෙසෙන වෙනත් පුද්ගලයින්ට විවෘත විය යුතු අතර එවැනි කිසිවකු විශ්වවිද්‍යාලයේ ගුරුවරයකු හෝ ශිෂ්‍යයකු ලෙස ඇතුළත් වීමට සුදුසුකම් ලැබීමට හෝ එහි කිසියම් පත්වීමක් ඉසිලීමට හෝ එහි උපාධිය ලබා ගැනීමට හෝ යම් වාසියක් ලබා ගැනීමට, භුක්ති විඳීමට හෝ ක්‍රියාත්මක කිරීමට හෝ එහි වරප්‍රසාද ලබා ගැනීමට ආගමික විශ්වාසයක් හෝ වෘත්තියක් පිළිබඳ මානකයක් සම්මත කර ගැනීම හෝ පැනවීම නොකළ යුතුය.*
>
> *(1978, විශ්වවිද්‍යාල පනත, 30 වන වගන්තිය)*

පීඨයේ උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (ඔඨක) විසින් තීරණය කරනු ලැබේ. 1978 විශ්ව විද්‍යාල පනත යටතේ, ආබාධිත තත්ත්වයන් සහිත අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීම ඇතුළුව උපාධි අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වගකීම දරයි. පීඨය සිය අධ්‍යයන වැඩසටහන් සඳහා ආබාධිත තත්ත්වයන් සහිත උපාධි අපේක්ෂකයින් නිරන්තරයෙන් ඇතුළත් කරගෙන ඇත. 2023 දී, පීඨයට ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් ලෙස හඳුනා ගන්නා ලද උපාධි අපේක්ෂකයින් 40 ක් පමණ ඇතුළත් විය.

---

[1] විශ්වවිද්‍යාල පිළිබඳ විශේෂ තීරණය (සංශෝධිත) පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණ (ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ) 5/99, ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා 1999 මැයි 3

## 2. අරමුණු

පහත සඳහන් දේ ඇතුළුව ආයතනයේ පාලනය තුළ අන්තර්කරණය සහතික කිරීම සඳහා පීඨයේ වගකීම් හඳුනා ගැනීමට සහ විස්තර කිරීමට මෙම ප්‍රතිපත්තිය අනුගමනය කෙරේ.

අ) අධ්‍යයන කටයුතු;
ආ) විෂය සමගාමී ක්‍රියාකාරකම්;
ඇ) විෂය බාහිර ක්‍රියාකාරකම්; සහ
ඈ) පරිපාලන කටයුතු.

## 3. විෂය පථය

මෙම ප්‍රතිපත්තිය පීඨය තුළ දී අදාළ වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, සිසුන් සහ පීඨය වෙනුවෙන් සහ ඒ යටතේ ක්‍රියා කරන ඕනෑම පුද්ගලයෙකු විසින් මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.

## 4. ප්‍රතිපත්තිය

### 4.1. මූලධර්ම

4.1.1. සියලුම පුද්ගලයන්ට අභිමානවත් සැලකීමක් ලැබීමට හිමිකම් ඇති බවත් ඔවුන් මානව හිමිකම් දරන්නන් බවත් පීඨය පිළිගනියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පිළිගෙන ඇති අතර ජාත්‍යන්තර නීතිය තුළ මානව හිමිකම් වඩාත් පුළුල් ලෙස පිළිගැනේ. ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ඇතුළු ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් ශ්‍රී ලංකාව විසින් අනුමත කර ඇත. එපමණක් නොව, අයිතිවාසිකම්වලට ගරු කිරීම සහතික කිරීම නීතිමය වගකීම්වලට පමණක් සීමා නොවන අතර එය මානව ගරුත්වය සහ ස්වාධිපත්‍යයට ගරු කිරීම ඇතුළු වටිනාකම් කිහිපයකට ගරු කිරීමට කැපවීමකි.

4.1.2. සාධාරණත්වය සඳහා පුද්ගලයන්ට සාධාරණ ලෙස සැලකීම අවශ්‍ය වන බව පිළිගන්නා ආකාරයෙන් අවස්ථාවන් ලබා ගැනීමේ සමානාත්මතාව සහතික කිරීම සඳහා පුද්ගලයන්ට සමානාත්මතාවෙන් සැලකීම අවශ්‍ය වන බව පීඨය පිළිගනියි.

4.1.3. පීඨයේ අධිකාරිය වෙනුවෙන් හෝ ඒ යටතේ ක්‍රියා කරන සියලුම පුද්ගලයන් තම කාර්යයන් අතරතුර සම්බන්ධ වන අනෙකුත් පුද්ගලයන්ගේ අභිමානයට සහ ස්වාධීනත්වයට ගරු කළ යුතුය. මෙයට ඉගැන්වීම සහ ඉගෙනීම, ක්ෂේත්‍ර වැඩ කටයුතු, පරිපාලන ක්‍රියාවලි, විනය කටයුතු, ක්‍රීඩා සහ විශ්‍රාන්ති ක්‍රියාකාරකම්, නේවාසික සන්දර්භයන් ආදිය ඇතුළත් වේ.

4.1.4. ආබාධිතභාවය නිශ්චිත සන්දර්භයක් තුළ හඳුනාගෙන තීරණය කරනු ලබන අතර සමාජීය හෝ ජීව විද්‍යාත්මක සාධක ඇතුළත් විය හැකිය. ආබාධිත තත්ත්වයන් විවිධ ස්වරූප ගත හැකි අතර ඒවා ශාරීරික, මානසික, බුද්ධිමය, සංජානන හෝ ඉගෙනුම් ආකාරවලට සම්බන්ධ විය හැකිය.

4.1.5. මානව ගරුත්වය සහ ස්වාධීනත්වයට ගරු කිරීම සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලය සහ සිසුන් පුහුණු කිරීමට පීඨය කැපවී සිටියි.

4.1.6. පීඨය සමානාත්මතාවට ඇති අයිතියට සහ වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමේ අයිතියට ගරු කිරීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා එහි ක්‍රියා පටිපාටි, භෞතික යටිතල පහසුකම් සහ ආයතනික සංස්කෘතිය පෙන්නුම් කිරීමට සහ වාරික සමාලෝචනයට කැපවී සිටී.

4.1.7. දේශන ශාලා, පරිපාලන ගොඩනැගිලි, නේවාසිකාගාර, ආගමික ස්ථාන සහ ආපනශාලා ඇතුළු භෞතික පරිසරය තුළ භෞතික ප්‍රවේශය සහතික කිරීමට පීඨය කැපවී සිටී.

4.1.8. සිසුන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය ඇතුළු පීඨයේ ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට සමානාත්මතාවේ පදනම මත පීඨයේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමේ අයිතිය ඇත.

4.1.9. පීඨය, අන්තර්කරණ කේන්ද්‍රය හරහා එහි කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට (පරිපාලන කාර්ය මණ්ඩලය, පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය සහ ආරක්ෂක සේවා ඇතුළුව) වැඩසටහන් සපයනු ලබන අතර, පීඨයේ සිසුන් සමඟ වැඩ කරන අනෙකුත් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට එවැනි වැඩසටහන් සඳහා (නේවාසිකාගාර පාලක පාලිකාවන් වැනි) සහභාගී වීමට ආරාධනා කළ හැකිය. මෙම පුහුණු වැඩසටහන් මගින් පුද්ගලයන්ට එකිනෙකාට ගෞරවයෙන් සැලකීමටත්, ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයින් ඇතුළු සියලුම පුද්ගලයින්ට වෘත්තීමය වශයෙන් තම වගකීම් ඉටු කිරීමටත්, අන්තර්කරණය සහ ප්‍රවේශ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දෙන්නේ කෙසේද යන්න දැන ගැනීමටත් මඟ පෙන්වනු ඇත.

4.1.10. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා භාරකරුවන් සහ මිතුරන් අත්‍යවශ්‍ය උපකාර සේවා සපයන බව පීඨය හඳුනා ගනී. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ගේ දෙමාපියෝ, විශේෂයෙන්, සෑම විටම ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට මග පෙන්වීමට සහ දිරිගැන්වීමට කැපවී සිටිති. පීඨය මෙම සේවාවන් හඳුනාගෙන ඇති අතර හැකිතාක් දුරට ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ගේ මිතුරන් හඳුනා ගැනීමට, ඔවුන් සහභාගී කරවා ගැනීමට සහ ඔවුන්ට සහාය වීමට උත්සාහ කරනු ඇත.

4.1.11. ආබාධිත තත්ත්වයන් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අභිමානය, ස්වාධීනත්වය සහ සමානාත්මතාවට ගරු කිරීම ඇතුළුව, ඔවුන්ගේ විෂය පථය තුළ ඇති කාරණා සම්බන්ධයෙන් සේවා ස්ථානයේ සාධාරණත්වය සහ සමානාත්මතාව සහතික කිරීමට පීඨය කැපවී සිටියි.

4.1.12. පීඨයේ අධිකාරිය යටතේ සිටින පුද්ගලයෙකුට තම අයිතිවාසිකම්වලට ගරු කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් හෝ දුක්ගැනවිල්ලක් ඇත්නම්, විශ්වවිද්‍යාල පනතේ ඇතුළත්ව ඇති පිළියම් සෙවීමට අදාළ සහය ලබාදීමට පීඨය සහ අන්තර්කරණ කේන්ද්‍රය කැපවී සිටියි. පීඨයේ අන්තර්කරණය සම්බන්ධ දුක්ගැනවිල්ලක් හෝ පැමිණිල්ලක් යමෙකුට තිබේ නම්, එම පුද්ගලයාට අධ්‍යයන කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය උපදේශකයෙකු, අධ්‍යයන උපදේශකයෙකු, අන්තර්කරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ, අධ්‍යයනාංශ ප්‍රධානියා හෝ පීඨාධිපතිවරයාගෙන් උපදෙස් ලබා ගත හැකිය. එවැනි අයකුගෙන් විමසූ විට දුක්ගැනවිල්ලට හෝ පැමිණිල්ලට ප්‍රතිචාර දැක්වීමට සහ අදාළ ක්‍රියාමාර්ගයන්ට ශිෂ්‍යයා යොමු කිරීම ඔවුන්ගෙන් අපේක්ෂා කෙරේ. එවැනි ඕනෑම පුද්ගලයෙකු දුක්ගැනවිල්ලේ හෝ පැමිණිල්ලේ රහසිගතභාවයට ගරු කළ යුතුය.

## 4.2 අන්තර්කරණ අවශ්‍යතා සහිත සිසුන් පීඨයට ඇතුළත් කර ගැනීම

4.2.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් පීඨයට ඇතුළත් කර ගැනීමේ දී පීඨයෙන් උපදෙස් ලබා ගන්නා විට, හැකිතාක් ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සංඛ්‍යාවකට පහසුකම් සැපයීමට පීඨය උත්සාහ කළ යුතුය.

4.2.2. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් හෝ වෙනත් අන්තර්කරණ අවශ්‍යතා ඇති සිසුන් ඇතුළත් කර ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා එහි යටිතල පහසුකම් සහ ක්‍රියාවලීන් තවදුරටත් වැඩිදියුණු කිරීමට පීඨය කැපවී සිටියි.

4.2.3. පීඨයට ඇතුළත් කර ගත හැකි සිසුන් සංඛ්‍යාව පිළිබඳව අන්තර්කරණ කේන්ද්‍රයට පීඨ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

4.2.4. පීඨයට ඇතුළත් කර ගත යුතු ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සංඛ්‍යාව හෝ වෙනත් අන්තර්කරණ අවශ්‍යතා පිළිබඳ තීරණය අන්තර්කරණ කේන්ද්‍රයේ අදහස් සලකා බලා පීඨ මණ්ඩලය විසින් ගනු ලැබේ.

4.3 අන්තර්කරණ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම

4.3.1. පීඨයේ සිසුන්ගේ අන්තර්කරණ අවශ්‍යතා හඳුනාගත හැක්කේ:

අ) ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කෝටාව අනුව ඇතුළත් කර ගැනීම සිදු කිරීමේ දී පීඨයට ඇතුළත් වන අවස්ථාවේ දී,

ආ) පීඨයට ඇතුළත් වන අවස්ථාවේ දී, පීඨය විසින් එහි ඇතුළත් වීමේ ක්‍රියාවලිය හරහා,

ඇ) ශිෂ්‍යයෙකුගේ ශිෂ්‍යභාවය තුළ ඕනෑම අවස්ථාවක, ශිෂ්‍යයා විසින්. එවැනි අවස්ථාවක, පීඨය, අන්තර්කරණ කේන්ද්‍රය හරහා ඒ සඳහා සාධාරණ සහ ගෞරවනීය සත්‍යාපන ක්‍රියාවලියක් තීරණය කරනු ඇත.

ඉහත කාර්යය සඳහා, අන්තර්කරණ කේන්ද්‍රය මගින් ලේඛනගත කිරීම, තොරතුරු රැස් කිරීම සහ අදාළ පරිදි ක්‍රියා කිරීම, පීඨ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

4.4 ශාස්ත්‍රීය කරුණු: සාමාන්‍ය

4.4.1. සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම අන්තර්කරණ කේන්ද්‍රය විසින් පීඨය සඳහා ශිෂ්‍ය සමීක්ෂණයක් සිදු කරනු ලැබේ. මෙම සමීක්ෂණයේ අරමුණ වන්නේ පීඨයේ සියලුම අධ්‍යයන කටයුතු සඳහා සියලුම සිසුන් අර්ථවත් ලෙස ඇතුළත් කර ගැනීම සහතික කිරීම සඳහා පීඨය විසින් ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන තක්සේරු කිරීමයි. සමීක්ෂණය අවම වශයෙන් පහත ක්‍රියාකාරකම් ආවරණය කරයි:

අ) ඉගැන්වීම සහ ඉගෙනීම
ආ) ඇගයීම (පැවරුම්, අධ්‍යයන වාර අවසාන විභාග)

උදාහරණ:

*ශ්‍රවණාබාධ සහිත ශිෂ්‍යයෙකුට දේශන පවත්වන විට කථිකාචාර්යවරයා නිශ්චිත වේගයකින් කතා කිරීම අවශ්‍ය විය හැකිය.*

*දෘශ්‍යාබාධිත සිසුවෙකුට සියලුම උපදෙස් ඔවුන්ට භාවිත කළ හැකි ආකෘතියෙන් නිකුත් කිරීම අවශ්‍ය විය හැකිය (බ්‍රේල්, ඩිජිටල් හෝ වෙනත් ඕනෑම ආකෘතියක් විය හැක).*

*ශාරීරික ආබාධිත තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකුට දේශන ශාලාවට ප්‍රවේශ වීමට හැකි පරිදි සැකසීම අවශ්‍ය විය හැක.*

4.4.2. අන්තර්කරණය සහතික කිරීම සඳහා ගත යුතු නිශ්චිත ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා අන්තර්කරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා ප්‍රධාන නිලධාරීන් සහ ඒකකයන් සමඟ රැස්වීමක් කැඳවනු ඇත.

උදාහරණ:

*විභාග අංශය, මොඩියුල ක්‍රමය සම්බන්ධීකරණය සඳහා වූ අන්තර්-පීඨ මධ්‍යස්ථානය (ICCMS), තත්ත්වාරක්ෂණ කමිටුව (Quality Assurance Cell), ශිෂ්‍ය උපදේශකයින්*

4.4.3. අන්තර්කරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා විසින් සමීක්ෂණය සහ යෝජිත ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ වාර්තාවක් සාකච්ඡාවට ලක් කිරීමට සහ අනුමැතිය සඳහා පීඨ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.

4.4.4. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු මානවශාස්ත්‍ර පීඨයේ ප්‍රජාව සඳහා ප්‍රසිද්ධ කරනු ඇත.

4.5. අධ්‍යයන කරුණු : ඉගැන්වීම සහ ඉගෙනීම

4.5.1. අධ්‍යයන නිදහසට ගරු කරමින් සියලුම ඉගැන්වීම් සහ ඉගෙනීම් සියල්ල අන්තර්කරණය වන ආකාරයෙන් සිදු කිරීම සහතික කිරීමට පීඨය කැපවී සිටී.

4.5.2. අධ්‍යයනාංශය හෝ පීඨය (අවස්ථානුකූලව) අන්තර්කරණ සහ උපකාරක ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ඇත.

4.5.3. ශිෂ්‍යයාගේ ආබාධිතභාවය මත පදනම්ව කිසිදු සිසුවෙකුට විෂයකට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කරනු නොලැබේ. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පීඨාධිපතිවරයා සහ විෂය පිරිනමනු ලබන එක් එක් අධ්‍යයනාංශය වෙත පැවරේ.

4.5.4. යම් විෂයයක ආබාධිත තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකුට නිශ්චිත පහසුකම් සැලසිය යුතු අවස්ථාවක, එම ශිෂ්‍යයාට සහ විෂය සඳහා සුදුසු ඉගැන්වීම් සහ ඉගෙනුම් සහ ඇගයීම් ක්‍රම සකස් කිරීම පිළිබඳව අධ්‍යයනාංශ ප්‍රධානියාට අන්තර්කරණ කේන්ද්‍රයෙන් උපදෙස් ලබා ගත හැකිය.

4.5.5. ආබාධිත තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකු නිශ්චිත විෂයයකට හෝ අධ්‍යයන විෂය ධාරාවකට අනුයුක්ත කළ විට, අදාළ අධ්‍යයනාංශයට පහත වගකීම් පැවරේ.

අ) ශිෂ්‍යයාගේ ප්‍රවේශ අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යයන උපදේශකයෙකුගෙන් (පහත බලන්න) සහ අන්තර්කරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයාගෙන් විමසීම; සහ

ආ) අන්තර්කරණ කේන්ද්‍රයේ අධ්‍යයන සම්බන්ධීකාරක සමඟ එක්ව, ශිෂ්‍යයාගේ නිශ්චිත ප්‍රවේශ අවශ්‍යතා පිළිබඳව කථිකාචාර්යවරයා දැනුවත් කිරීම.

4.5.6. අධ්‍යාපනයට සමාන හා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම සඳහා පන්ති සහභාගීත්වය සඳහා ප්‍රවේශය, විසම්මුතිය සහ මතයක් ප්‍රකාශ කිරීමේ නිදහස අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සහතික කළ යුතුය. ඕනෑම ඉගැන්වීමේ සහ ඉගෙනීමේ අභ්‍යාසයක සියලුම සහභාගිවන්නන් අන්‍යෝන්‍ය ගෞරවයේ පදනම මත එසේ කළ යුතුය. කිසිදු ආකාරයක හිරිහැරයක් හෝ අගෞරවයක් සිදු නොකළ යුතුය.

4.5.7. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම්වල නියැළීමේ දී අදාළ උපකාරක උපාංග භාවිත කිරීමට අවසර ඇත.

4.5.8. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට අධ්‍යයන මෙවලම් වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම සඳහා ඔවුන්ට සුදුසු සේවාවක් පුස්තකාල සේවාවන්ට ඇතුළත් විය යුතුය. පුස්තකාලවලට භෞතිකව ප්‍රවේශ වීම සහතික කිරීම, ලබාගත හැකි ආකෘතිවලින් පොත් සැපයීම සහ පුස්තකාල සේවා ලබා ගත හැකි බව සහතික කිරීම මෙයට ඇතුළත් විය හැකිය. එවැනි ප්‍රවේශ සහතික කිරීම සඳහා අන්තර්කරණ කේන්ද්‍රයට පුස්තකාලය සමඟ කටයුතු කළ හැකිය.

4.6. අධ්‍යයන කරුණු: ඇගයීම සහ විභාගය

4.6.1. අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ඇගයීම් සැලසුම් කිරීමේ දී, සිසුන්ගේ ප්‍රවේශ අවශ්‍යතා, විශේෂයෙන්ම ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ගේ අවශ්‍යතා සලකා බැලීම අවශ්‍ය වේ.

උදාහරණ:

*ක්ෂේත්‍ර කටයුතු අවශ්‍ය වේ නම්, ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා සාධාරණ ලෙස පහසුකම් සැලසිය යුතුය.*

*පන්තිය තුළ සිදුකරන විභාගයක දී දෘශ්‍යාබාධිත ශිෂ්‍යයෙකුට භාවිත කළ හැකි ආකෘතියකින් ප්‍රශ්න පත්‍රය සැපයීම අවශ්‍ය විය හැක.*

4.6.2. පවරන ලද ලකුණු/ශ්‍රේණිය ඇතුළුව අඛණ්ඩ ඇගයීම් පිළිබඳ ප්‍රතිපෝෂණ සැපයීමේ දී, පීඨය, හැකිතාක් දුරට, ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් ප්‍රතිපෝෂණ ලබා දෙනු ඇත.

4.6.3. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට ඇගයීම් සහ විභාගවල නියැළීමේ දී අදාළ උපකාරක උපකරණ භාවිත කිරීමට අවසර ඇත. මේ සම්බන්ධයෙන් තාක්ෂණික සංවර්ධනයන් ඇතුළත් කිරීම සඳහා මානවශාස්ත්‍ර පීඨය සිය නීති රීති යාවත්කාලීන කිරීමට කැපවී සිටියි.

උදාහරණ:

*ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට තම විභාගය සඳහා පරිගණක භාවිත කිරීමට අවසර දීම.*

4.6.4. අවශ්‍ය අවස්ථාවල දී, ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට ඔවුන්ගේ ඇගයීම් සහ විභාග සම්පූර්ණ කිරීමට අමතර කාලයක් ලබා දෙනු ඇත. එම පහසුකම ලබා දීමට අවසර ලබා ගැනීම සඳහා පීඨය විශ්වවිද්‍යාලය තුළ සිටින අදාළ නිලධාරීන් සහ අංශ සමඟ කටයුතු කරනු ඇත.

4.7 විෂය සමගාමී ක්‍රියාකාරකම්

4.7.1. විෂය සමගාමී ක්‍රියාකාරකම් අන්තර්කරණ ආකාරයෙන් සිදු කරන බවට පීඨය සහතික කරයි. කුසලතා සහ හැකියාව එවැනි ක්‍රියාකාරකම්වලට සහභාගී වීම සඳහා නිර්ණායක වන අතර, අදාළ අවස්ථාවන්හි සාධාරණ ප්‍රවේශයක් සහ සහභාගීත්වයක් ලබා දීමට පීඨය කැපවී සිටියි.

4.7.2. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සියලුම සිසුන් ඇතුළත් කර ගැනීම සහ ප්‍රවේශය සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි මූල්‍ය සහ පරිපාලන සහාය ලබා ගැනීමට පීඨය කැපවී සිටියි.

4.8 විෂය බාහිර ක්‍රියාකාරකම්

4.8.1. ක්‍රීඩා, නාට්‍ය සහ සංගීතය වැනි විෂය බාහිර ක්‍රියාකාරකම් සිසුන්ට විවෘත විය යුතුය. අන්තර්කරණය සහ ප්‍රවේශය සහතික කිරීම සඳහා අදාළ ක්‍රියා පටිපාටි, භෞතික පරිසරයන් සහ මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම සඳහා පීඨය විශ්වවිද්‍යාලය තුළ අදාළ ආයතන සමඟ කටයුතු කර සාකච්ඡා කරනු ඇත.

උදාහරණ:

*ශ්‍රවණාබාධ සහිත සිසුන් ක්‍රීඩා කටයුතුවලටත්, ශාරීරික ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් නාට්‍යවලටත් සහභාගි වීමට උනන්දු විය හැකිය.*

4.9. පරිපාලන කටයුතු

4.9.1. සියලුම පරිපාලන ක්‍රියා පටිපාටි භෞතික ප්‍රවේශය, භාෂාව හෝ සේවාවේ ගුණාත්මකභාවය අනුව අන්තර්කරණයෙන් යුක්ත විය යුතු අතර ප්‍රවේශතාව තිබිය යුතුය.

උදාහරණයඃ

*පරිපාලන දැන්වීම් ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් සැපයිය යුතුය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව දේශීය භාෂා දෙකෙන්ම දැන්වීම් නිකුත් කළ යුතුය.*

4.9.2. සමානාත්මතාව, අභිමානය සහ අන්තර්කරණ පදනම මත නේවාසිකාගාර පහසුකම් සැපයිය යුතුය. නවාතැන් සම්බන්ධයෙන් සිසුන්ගේ සාධාරණ අවශ්‍යතා සපුරාලීමට පීඨය කැපවී සිටී.

උදාහරණයඃ

*ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට අනෙකුත් සිසුන් සමග නේවාසිකාගාරවල නවාතැන් පහසුකම් ලබා දෙනු ලැබේ. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා වෙන් කර ඇති කාමරවලට ඔවුන් වෙන් නොකෙරේ. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් ළඟම ඇති නේවාසිකාගාරයට අනුයුක්ත කෙරේ.*

4.9.3. උපකාරක උපාංග භාවිත කරන සිසුන් සඳහා සාධාරණ ලෙස හැකි සෑම විටම පරිපාලන කාර්ය මණ්ඩලය සහාය ලබා දෙනු ඇත.

උදාහරණයඃ

*අධ්‍යයන කටයුතු සඳහා ලැප්ටොප් පරිගණක භාවිත කරන සිසුන්ට එම උපාංග ක්‍රියාත්මක කිරීමේ දී සහාය අවශ්‍ය විය හැකිය.*

4.10. පහසුකම්

4.10.1. පීඨය, අන්තර්කරණ කේන්ද්‍රය හරහා පීඨය අන්තර්කරණයෙන් යුතු බව සහතික කිරීමට උත්සාහ කරනු ඇත. අන්තර්කරණය තුළ ආබාධිත තත්ත්වයන් සහ විවිධත්වය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ සහ කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර විවිධත්වයට ගරු කරන ක්‍රියාවලීන් ඇතුළත් වන විශ්වීය සැලසුම ඇතුළත් වේ.

උදාහරණයඃ

ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට අන්තර්කරණ කේන්ද්‍රයට යාබදව ඇති සුහුරු (ස්මාර්ට්) පන්ති කාමරයට සහ උපකාරක සහිත වැසිකිළියට ප්‍රවේශය ඇත.

4.11. කාර්ය මණ්ඩලයේ අන්තර්කරණ අවශ්‍යතා

4.11.1. අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන සහ පීඨයේ වෙනත් ඕනෑම සාමාජිකයෙකුට (කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලය වැනි) සමානව හා ගෞරවාන්විතව සැලකුම් ලැබීමට අයිතියක් ඇත.

4.11.2. ආබාධිත තත්ත්වයන් සහිත ඕනෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට අදාළ තීරණ ගැනීමේ ආයතනවල නියෝජනය ලබා ගැනීමට සහ උපදේශනය ලබා ගැනීම සඳහා අයිතියක් ඇත.

4.12. කේන්ද්‍රීය ලක්ෂ්‍යය

4.12.1. මෙම ප්‍රතිපත්තියේ විශේෂයෙන් දක්වා නොමැති පීඨයේ අන්තර්කරණයට අදාළ වෙනත් ඕනෑම කරුණක් සඳහා අන්තර්කරණ කේන්ද්‍රය කේන්ද්‍රස්ථානය වනු ඇත.

4.12.2. අන්තර්කරණ කේන්ද්‍රය ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට සහ පීඨය තුළ අන්තර්කරණය සම්බන්ධයෙන් අභියෝගවලට මුහුණ දෙන ඕනෑම සිසුවෙකුට උපදේශන සහාය ලබා දෙනු ඇත.

4.13. අන්තර්කරණ පුහුණුව

4.13.1. මෙම ප්‍රතිපත්තිය පිළිබඳව පීඨයේ සියලුම කාර්ය මණ්ඩලය සහ පුද්ගලයින් (අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන, ආරක්ෂක, පිරිසිදු කිරීමේ සහ පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලය) පුහුණු කිරීම අන්තර්කරණ කේන්ද්‍රයේ වගකීම වේ.

4.13.2. කේන්ද්‍රය නවක සිසුන් ඇතුළු සිසුන්ට අනුස්ථාපන, සංවේදීකරණය හෝ පුහුණු වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.

4.14. අන්තර්කරණ ප්‍රතිඥාව

4.14.1. සියලුම කාර්ය මණ්ඩලය සහ නවක සිසුන් විසින් පීඨයේ සියලුම කටයුතුවල දී විවිධත්වයට ගරු කරන බවට ප්‍රතිඥා දීම පීඨය විසින් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රකාශය පීඨ මණ්ඩලයේ අනුමැතිය සඳහා කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා විසින් යෝජනා කරනු ලබන අතර වරින් වර සමාලෝචනය කළ හැකිය. පහත දැක්වෙන කරුණු ප්‍රතිඥාවට ඇතුළත් වේ:

අ) ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයින්ගේ අභිමානයට සහ ස්වාධීනත්වයට ගරු කිරීමට කැපවීම;

ආ) අවිහිංසාව සහ වෙනස්කම් සඳහා අන්‍යෝන්‍ය ගෞරවය සඳහා කැපවීම; සහ

ඇ) ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, භාෂාව, සමාජ-ආර්ථික තත්ත්වය හෝ ලිංගික දිශානතිය මත පදනම් වූ වෙනස්කම් ඇතුළුව සමාජයේ වෙනස්කම්වලට ගරු කිරීමට කැපවීම.

4.14.2. අන්තර්කරණය පිළිබඳ සැසියකින් අනතුරුව සහ මෙම ප්‍රතිපත්තිය පිළිබඳ හැඳින්වීමකින් පසුව ඔවුන්ගේ අනුස්ථාපන වැඩසටහනේ දී සිසුන් විසින් මෙම ප්‍රතිඥාව ලබා දීම අපේක්ෂා කෙරේ.

5. ක්‍රියාත්මක කිරීම

5.1.1. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පහත සඳහන් නිලධාරීන්ට සහ ආයතනවලට පවරා ඇත.

අ) අධ්‍යයන කටයුතු: පීඨාධිපති සහ පීඨ මණ්ඩලය, අධ්‍යයනාංශ ප්‍රධානීන්, අධ්‍යයන උපදේශකයින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය

ආ) විෂය සමගාමී ක්‍රියාකාරකම්: පීඨාධිපති සහ පීඨ මණ්ඩලය, අධ්‍යයනාංශ ප්‍රධානීන්, ශිෂ්‍ය උපදේශකවරුන් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය

ඇ) විෂය බාහිර ක්‍රියාකාරකම්: ශිෂ්‍ය සංගම්වල ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරුන්, ශිෂ්‍ය උපදේශකයින්

ඈ) පරිපාලන කටයුතු: පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා

ඉ) ප්‍රතිපත්තිය සමස්තව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම: අන්තර්කරණ කේන්ද්‍රය

ඊ) ප්‍රතිපත්තිය පිළිබඳ පුහුණුව ලබා දීම: අන්තර්කරණ කේන්ද්‍රය

6. ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා අධ්‍යයන උපදේශකයින්

6.1 පීඨය විසින් අදාළ අංශ ප්‍රධානියා සමඟ සාකච්ඡා කර (අවස්ථානුකූලව) ආබාධිත තත්ත්වයන් සහිත සිසුන් සඳහා අධ්‍යයන උපදේශකයින් පත් කරනු ලැබේ. අධ්‍යයන කටයුතුවලට සහභාගී වීමේ අරමුණින් ශිෂ්‍යයාගේ අවශ්‍යතා අධ්‍යයනාංශයට, අන්තර්කරණ කේන්ද්‍රය සහ පීඨය වෙත සන්නිවේදනය කිරීමට උපකාර කිරීමේ වගකීම අධ්‍යයන උපදේශකවරයා භාර ගනියි.

6.2. අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සියලු ඉගැන්වීම් සහ ඉගෙනීම් අන්‍යෝන්‍ය ගරුත්වය සහිත පරිසරයක් තුළ සිදු වන බව සහතික කිරීම අපේක්ෂා කෙරේ. අන්‍යෝන්‍ය ගෞරවයේ පදනම මත ඕනෑම ආකාරයක විවිධත්වයන් සහ වෙනස්කම් ඉවසිය යුතුය. එවැනි වෙනස්කම්වලට මතභේද, වාර්ගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, භාෂාව, සමාජ-ආර්ථික තත්ත්වය, ලිංගික දිශානතිය හෝ එවැනි වෙනත් ඕනෑම පදනමක් මත වන විවිධත්වයන් ඇතුළත් විය හැකිය.

6.3 අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශයක් හඳුනා ගැනීම සහ සහාය වීම අපේක්ෂා කෙරේ. සාධාරණ ප්‍රවේශය එක් එක් සිද්ධිය අනුව තීරණය කළ යුතුය. ශාරීරික ආබාධිත තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකුට භෞතික ප්‍රවේශය සහතික කිරීම, ඉගෙනීමේ ආබාධිත තත්ත්වයන් සහිත ශිෂ්‍යයෙකුට සාධාරණ පහසුකම් සැපයීම හෝ ශිෂ්‍යයෙකුගේ භාෂා අයිතියට ගරු කිරීම ඊට ඇතුළත් විය හැකිය.

6.4 අධ්‍යයන උපදේශකයින් අන්තර්කරණ කේන්ද්‍රය සහ පීඨාධිපති හරහා පීඨ මණ්ඩලයට වාර්තා කරයි. වාර්තාව පහත සඳහන් දෑ ඇතුළුව පීඨයේ අන්තර්කරණය පිළිබඳ වාර්තා කළ යුතුය:

අ) ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ට සමානාත්මතාව සඳහා ඇති අයිතිය සහතික කිරීම සඳහා වන අවශ්‍යතා පදනම සම්බන්ධයෙන්;

ආ) ඉගැන්වීම සහ ඉගෙනීම සහ ඇගයීම සඳහා සපයා ඇති පහසුකම් සම්බන්ධයෙන්; සහ

ඇ) පීඨය විසින් ප්‍රතිපත්තිමය තීරණ අවශ්‍ය වන විශේෂිත කරුණු සම්බන්ධයෙන්.

7. වාර්තා කිරීම

7.1 අන්තර්කරණ කේන්ද්‍රය විසින් වාර්ෂික වාර්තාවක් පීඨ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙම වාර්තාව සකස් කිරීමේ දී කේන්ද්‍රයට ආබාධිත හෝ අන්තර්කරණ අවශ්‍යතා ඇති සිසුන්ගෙන් සහ කාර්ය මණ්ඩලයෙන් උපදෙස් ලබා ගත හැක. වාර්තාවට පහත කරුණු ඇතුළත් විය යුතුය:

අ) එහි ක්‍රියාකාරකම්වල සාරාංශයක්;

ආ) ඉගැන්වීම් සහ ඉගෙනුම්, ඇගයීම් සහ වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක් සඳහා සපයා ඇති සාධාරණ පහසුකම් පිළිබඳ විස්තර;

ඇ) උගත් පාඩම් හෝ අන්තර්කරණය පිළිබඳ ප්‍රශස්ත භාවිතය;

ඈ) මුහුණ දුන් අභියෝග; සහ

ඉ) ප්‍රතිපත්තිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ.

8. අරමුදල් සැපයීම

8.1 විශ්වවිද්‍යාල සුභසාධක ශාඛාව මගින් වෙන් කරන ප්‍රතිපාදනවලට අමතරව, පීඨය විසින් ආබාධිත තත්ත්වයන් සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා එහි සංවර්ධන අරමුදලින් මුදල් වෙන් කරනු ලැබේ. තවද, සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීමට උපකාර කිරීම සඳහා පීඨයට විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථී සංසදය වැනි වෙනත් අය සමඟ හවුල් විය හැකිය.

9. ප්‍රචාරණය

9.1.1. මෙම ප්‍රතිපත්තිය කේන්ද්‍රයේ/ පීඨයේ වෙබ් පිටුවෙහි ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් (ප්‍රවේශ විය හැකි ආකෘතිවලින්) ලබා ගත හැකිය.

10. සමාලෝචනය

10.1 මෙම ප්‍රතිපත්තිය පීඨයේ පීඨ මණ්ඩලයේ උපදෙස් මත කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා විසින් වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

11. අනුවාද ඉතිහාසය

සංශෝධනය 1

සංශෝධනය 2

සඳහා යොදාගෙන ඇත.